**ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

# පුරප්පාඩු

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගණකාධිකාරී (පුරප්පාඩු 01)

**01. රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳව ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම හා ඒ සඳහා වූ තාක්ෂණික දැනුම ලබාදීම ආයතනයේ මූල්‍ය කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම, සැලසුම් කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය සහය ලබා දීම.

**02. සුදුසුකම් හා පළපුරුද්ද**

**(2.1) බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය ඇතුළත් මූලික උපාධියක් ලබා තිබීම.

**හෝ**

CIMA (UK) අවසන් අදියර සමත් වී තිබීම හෝ ACCA(UK) අවසන් අදියර සමත් වී තිබීම. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය පිළිබඳ අවසන් අදියර සමත්ව තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය (HNDA) සමත්ව තිබීම.

**සහ**

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක රාජ්‍ය මණ්ඩලයක හෝ පිළිගත හැකි ආයතනයක වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම

(ආ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමට හැකියාවක් තිබිය යුතුය.

**(3) වැටුප් පරිමාණය :**

MM 1-1 2016 – (රු.53,175 – 10X1,375 – 15X1,910 = රු.95,575)

**(4) වයස :**

අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**(5) බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**(6) කොන්දේසි**

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

- අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
- මෙම තනතුර ස්ථිරය, සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිතය. (අපේක්ෂකයින් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3%ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
- අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය.
- අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකද සමග තම ජීව දත්ත තොරතුරු 2023.12.14 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12, සුගතදාස ස්ටේඩියම් – බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- එසේ නොවන සහ අයදුම්පත් භාර ගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම්කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**
**011-3071838**